**මධ්‍යම පරිසර අධිකාරිය - 2014**

මධ්‍යම පරිසර අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 6 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටීන් සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණන විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 02. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව වර්ෂයක කාලයක් තුළ නිරවුල් කළ නොහැකි රු. 7,887,531 ක් වූ කොම්පෝස්ට් බින් සංචිත සහ රු.66,286,032ක් වූ පරිසර බලපෑම් ඇගැයීම් වාර්තා සඳහා තැන්පතු ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ගිණුම්කරණ ප්‍රමිති අංක 07 අනුව සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් භාවිතයට ගනු ලබන වත්කම් සාධාරණ අගයට පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගනනය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රමිති

රජය මගින් වාර්ෂිකව ලබා දෙනු ලබන ආධාර ගිණුම් තැබීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව සිදු කරන බව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණි. එසේ වූවත් මෙකී ප්‍රමිතියට අනුව රජයේ ආධාර ලැබීම් ගිණුම් තැබීම සම්බන්ධව හෙළිදරව් කළ යුතු කරුණු හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රදාන වශයෙන් ලද රු.132,787,410 ක් වූ වාහන 11 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් ලැබුණු මෝටර් රථයක් ගිණුම් ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂයවීම් රු. 2,151,875 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) දෛනික ආහාර දීමනා ලෙස ගෙවා තිබුණු රු. 10,131,559 ක් වැටුප් හා දීමනා ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ගමන් වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඈ) කොයිකා ව්‍යාපෘතියෙන් ඉදිකිරීම් සිදුකර ඇති ඉඩම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 900,000 ක තක්සේරු ගත වාර්ෂික බදු මුදල ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

#### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) පිළිසරු ව්‍යාපෘතිය ගෙවිය යුතු කොන්ත්‍රාත් වියදම් | 121,440,643 | බිල්පත්, කළ වැඩ වාර්තා |
| (ආ) පිළිසරු ව්‍යාපෘතිය බඩුන් මිලදී ගැනීම | 1,188,000 | භාණ්ඩ ලැබීම් පත්‍ර (GRN) තොග ලේඛන |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

කොයිකා ව්‍යාපෘතියෙන් 2012 වර්ෂයේ පිළිසරු ව්‍යාපෘතියට දුන් රු 2,318,106 ක් වූ අත්තිකාරම් මුදලක්, ලැබිය යුතු රු. 81,579,241 ක් හා ගෙවිය යුතු වියදම් රු. 71,769,174 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත | ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියේ නිලධාරීන් වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම් සඳහා රු. 603,000 ක් වෙන්කිරීම් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.109,775 ක් එක් නිලධාරියෙකු ඉවත්ව යාමේදී ගෙවා තිබුණි. |
| (ආ) | 2006 ඔක්තෝබර් 10 දිනැති අංක 1466/5 දරන ගැසට් පත්‍රය. | ඝනකමින් මයික්‍රෝන 20 හෝ ඊට අඩු පොලිතීන් දේශීය භාවිතය සඳහා නිෂ්පාදනය කිරීම, පොලිතීන් නිෂ්පාදනයන් විකිණීමට හෝ භාවිතා කිරීම තහනම් කර තිබුණද මෙකී නියෝගයක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 10.3 වගන්තිය | නිලධාරියෙකුගේ ආපදා ණය ප්‍රමාණය මාස 10 ක මූලික වැටුප පදනම් කරගෙන ගෙවිය යුතු වුවත් අධිකාරිය විසින් එම ණය ප්‍රමාණය මාස 10 ක දළ වැටුප පදනම් කරගෙන ගෙවා තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 90 දෙනෙකුට රු.9,748,685 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි. |
| (ඈ) | 1994 ජුනි මස 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් 23 දෙනෙකු සඳහා ප්‍රවාහන දීමනාවක් ලෙස රු.2,421,000 ක මුදලක් හා අධිකාරියේ නිලධාරීන් සඳහා ආහාර දීමනාවක් ලෙස රු. 10,131,559 ක මුදලක් ද, නිල නිවාස සඳහා 2012 වර්ෂයේ සිට නිලධාරීන් දෙදෙනෙක් සඳහා රු. 282,500 ක් ද භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් වු ප්‍රවාහන පහසුකම් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට පමණක් හිමි වන නමුත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාටද ප්‍රවාහන පහසුකම් සපයා තිබුණි. |
| (ඊ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 5.4.12 වගන්තිය | ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා එකතු කළ අගය මත බදු (VAT) ප්‍රතිපූර්ණය කිරීම් විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් වෙත යැවිය යුතු වුවත් කොයිකා ව්‍යාපෘතියේ බිම් පිරවුම් ඉදිකිරීමට අදාලව ඉදිකිරීම් සමාගමට ප්‍රතිපූර්ණය කර තිබුණු රු. 3,610,027 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (උ) | 2007 පෙබරවාරි 28 දිනැති සී එස් ඒ/සී1/40 අංක දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය | හෝටල් ගාස්තු රජයේ මුදලින් නිරවුල් නොකළ යුතු බව දක්වා තිබියදී ඊට පටහැනිව ප්ලාස්ටික් ව්‍යාපෘතිය මඟින් වැඩමුළු, රැස්වීම් පැවැත්වීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී හෝටල් ගාස්තු වෙනුවෙන් රු.324,965 ක් වැයකර තිබුණි. |

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවු ගනුදෙනු**

සමාලෝචිත වර්ෂයේ සිට "පරිසර අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය ශ්‍රී ලංකාව" යන නමින් ආයතනයක් පිහිටුවා සහතික පත්‍ර පාඨමාලා වැඩසටහන් පැවැත්වීමට සහ පාඨමාලා සඳහා මුදල් අය කිරීමටත් කටයුතු කර තිබුණි. මේ සඳහා අභ්‍යන්තර හා බාහිර දේශකයින් සහභාගි කරගෙන තිබුණි. මෙම පාඨමාලාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ වෙනම ආයතනයක් ලෙස බලාත්මක නොකර භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු. 19,185,000 ක ප්‍රතිපාදන යොදවා ක්‍රියාත්මක කර තිබුණු බව නිරීක්ෂණය විය. මෙවැනි කටයුතු සඳහා ජාතික පාරිසරික පනතේ 10 වන වගන්තියේ "(ග)" අනුව මුදල් අයකිරීමේ බලයක් අධිකාරියට නොමැති බව ද තවදුරටත් නිරීක්ෂණය විය.

**3. මූල්‍ය සාමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ හා ඊට අදාල ව්‍යාපෘති 03 හි මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 52.7 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු. මිලියන 49.4 ක අතිරික්තය සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 102.1 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ සමස්ත ආදායම රු.මිලියන 150.6 කින් වැඩි වී තිබුණද මෙහෙයුම් වියදම රු. මිලියන 252.7 කින් වැඩිවී තිබීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 අධිකාරියට එරෙහිව හෝ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පරිසර දූෂණය වන පරිදි කටයුතු කිරීම සහ පරිසර බලපත්‍ර ලබා නොගැනීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් බාහිර ආයතන හා පුද්ගලයින්ට එරෙහිව සමාලෝචිත වර්ෂය අවසානය වන විට නඩු 116 ක් අධිකරණවල ගොනුකර තිබුණි.

(ආ) බාහිර ආයතනයක් රු.මිලියන 460 ක වන්දියක් සහ පුද්ගලයෙකු විසින් නඩු පැවරු දින සිට දිනකට රු.10,000 බැගින් වන්දි ඉල්ලා අධිකාරියට විරුද්ධව නඩු පවරා තිබුණු නමුත් එකී

නඩු වලින් පැන නැගිය හැකි අසම්භාව්‍ය වගකීම්වල ස්වභාවය පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

## 04. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

අධිකාරිය විසින් එය පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක වෙමින් පැවති ප්‍රධාන ව්‍යාපෘති 04 ක් සම්බන්ධව නිරීක්ෂණ හා ඒවායේ කාර්යසාධනය පහත පරිදි විය.

(අ) ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරකම් සඳහා රු.මිලියන 45 ක් වෙන්කර තිබුණු අතර එයින් රු.මිලියන 42.8 ක් වැයකර තිබුණි. මේ පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i). ක්‍රියාකාරී සැලැස්මේ පැවති ක්‍රියාකාරකම් 22 ක් සඳහා වෙන්කර තිබූ රු.17,413,000 ක් සංශෝධනයේදී ඉවත් කර තිබුණි.

(ii). තවද මුල් ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් නොවූ ක්‍රියාකාරකම් 02 ක් සඳහා රු.12,073,000 ක් ගෙවා තිබුණි.

(iii). සමාලෝචිත වර්ෂයේ වැය කර තිබුණු රු.මිලියන 42.8 ක වියදමින් රු.මිලියන 11.6 ක් හෙවත් සියයට 27 ක් මෙහෙයුම් හා කාර්ය මණ්ඩල සංවර්ධන වියදම් ලෙස වැය කර තිබුණි.

(iv). ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් 03 ක් සඳහා වෙන් කළ මුදලින් සියයට 50 ක් හෙවත් රු. 1,930,000 ක් ඉතිරි වී තිබුණි.

(ආ) දොම්පේ සනීපාරක්ෂක බිම් පිරවුම් ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු ආධාර වලින් කසල ප්‍රවාහන ගාබේජ් ට්‍රක් රථ හා ඩෝසර් මිලදී ගනු වෙනුවට ඩබල් කැබ් රථ 02 ක් හා ඉසුසු කැබ් රථ 01 ක් ලබාගෙන තිබූ අතර එකී වාහන පරිසර අධිකාරියේ නිලධාරීන් සඳහා වෙන්කළ වාහන ලෙස අනුයුක්ත කර තිබුණි. තවද ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබූ ජීප් රථයක් හා වෑන් රථයක් පිළිසරු ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබුණු අතර කම්පැක්ටර් 02 ක් අනුමැතියකින් තොරව කඩුවෙල නගර සභාවට ලබාදී තිබුණි. මේ අනුව ව්‍යාපෘතියේ මූලික අරමුණ කසළ කළමනාකරණය වුවද එම ව්‍යාපෘතියේ වත්කම් වෙනත් අරමුණු සඳහා යොදවාගෙන ඇති බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ මාර්තු 24 දින ඉදිකිරීම් නිමකර අධිකාරිය වෙත භාරදෙන ලද ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ නොකර වසරකට අධික කාලයක් නිෂ්කාර්යව පැවති බව 2015 මාර්තු 06 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) ආර්ථික සහයෝගිතා අරමුදල් ණය පහසුකම් මත ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (EDCF)

ව්‍යාපෘති ණය ගිවිසුම අනුව කොරියන් රජයෙන් ඩොලර් මිලියන 33.536 ක් හා ශ්‍රී ලංකා රජයෙන් ඩොලර් මිලියන 8.350 ක් යොදවා ව්‍යාපෘතිය 2013 නොවැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණු අතර ව්‍යාපෘතිය මාස 48 කින් නිමකළ යුතු විය. 2015 ජුනි වන විට ව්‍යාපෘතිය ආරම්භ කර වසර 01 යි මාස 06 ක කාලයක් ගතවී තිබුණද යෝජිත බිම් පිරවුම් මධ්‍යස්ථාන 04 හි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. මෙම ප්‍රමාදය නිසා සමාලෝචිත වර්ෂයේදී කොරියන්

රජයෙන් ලබා දීමට එකග වී තිබුණු එ.ජ.ඩොලර් 1,340,608 ක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදවා ගැනීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ඇ) පිළිසරු ව්‍යාපෘතිය

2008 – 2010 දක්වා වර්ෂ 03 ක කාලපරිච්ඡේදය තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණු ව්‍යාපෘතිය වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් රු. බිලියන 5.633 ක් වෙන්කර දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i). ව්‍යාපෘතිය 2010 වර්ෂයේ නිමකිරීමට සැලසුම් කර තිබුණද 2015 අගෝස්තු අවසානය දක්වාම අවසන් කර නොතිබුණු අතර ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබු රු.බිලියන 5.633 ක මුදලින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා උපයෝජනය කර තිබුණේ රු. බිලියන 2.352 ක් හෙවත් සියයට 42 ක් පමණි.

(ii). ව්‍යාපෘතියේ අරමුණක් වන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සංරචකය යටතේ ප්‍රාදේශීය සභාවන් 117 ක කොම්පෝස්ට් අංගන ඉදිකිරීම සඳහා ව්‍යාපෘතිය රු.මිලියන 1,533.34 ක මූල්‍ය අනුග්‍රහය දක්වා තිබුණි. මෙම අංගන වලින් කොම්පෝස්ට්කරණය ගැටළු සහිතව සිදු කරන අංගන 23 ක්, ඉදිකිරීම් අවසන් කළ නමුත් කොම්පෝස්ට්කරණය සිදු නොකරන අංගන 06 ක්, ඉදිකිරීම් ක්‍රියාත්මක වෙමින් පවතින අංගන 04 ක් සහ අක්‍රිය අංගන 04 ක් පවතින බව නිරීක්ෂණය විය.

(iii). මීට අමතරව ප්‍රාදේශීය සභා 03 ක කොම්පෝස්ට් අංගන ඉදිකිරීම සඳහා රු. 6,772,253 ක් ලබා දී තිබුණු අතර ඉන් එක් අංගනයක ඉදිකිරීම් කටයුතු 2015 ජුනි 15 දින දක්වා නිමකර නොතිබුණි. අංගන 02 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබු අතර කොම්පෝස්ට් අංගනයක් විදේශාධාර මත ඉදිකරමින් පවතින ස්ථානයක තාවකාලික අංගනයක් ඉදිකිරීම සඳහා මෙම ව්‍යාපෘතියෙන් රු.මිලියන 04 ක් ආර්ථික නොවන ආකාරයට වැයකර තිබුණි.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් පදනම මත පසු භාවිත ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට සියළුම දීමනා සහිතව රු. 45,000 ක මාසික වැටුපක් හා ජීවන වියදම් දීමනාවක් පමණක් හිමි විය යුතු වුවද ඊට පටහැනිව නිල වාහනය සඳහා වාහන කුලී සහ ඉන්ධන දීමනා ලෙස 2013 වර්ෂයේදී මසකට රු.70,000 බැගින් අවස්ථා 13 ක දී රු.690,967 ක් ගෙවා තිබූ අතර 2014 අගෝස්තු 01 දින සිට අධිකාරියේ මෝටර් රථයක් සහ පෙට්‍රල් ලීටර් 140 කට අදාල ඉන්ධන දීමනාවක් ලබාදී තිබුණි.

(ආ) ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය මගින් 2009 වර්ෂයේ සිට ගබඩාව සඳහා නිවසක් කුලියට ලබාගෙන තිබු අතර මේ සඳහා 2014 වර්ෂයේදී මාසික කුලිය ලෙස රු. 30,000 ක්, විදුලිය හා ජලය සඳහා රු. 600 ක් හා ආරක්ෂකයෙකු සඳහා රු. 15,000 ක් ලෙස මසකට රු. 45,600 ක් බැගින් රු. 2,699,400 ක් 2009 ජනවාරි සිට 2014 අගෝස්තු දක්වා ගෙවා තිබුණද 2014 වර්ෂය සඳහා කුලී ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. අදාල ආරක්ෂක දීමනාව මසකට රු.15,000 බැගින් ගෙවා තිබුණද විගණනය විසින් භෞතිකව පරීක්ෂා කරන ලද අවස්ථාවේ කිසිදු ආරක්ෂක නිලධාරියෙකු ගබඩාව භාරව නොසිටි අතර පැමිණීමේ ලේඛනයක්ද නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිළිසරු ව්‍යාපෘතියේ අරමුණුවලින් බැහැරව මධ්‍යම පරිසර අධිකාරියේ වැඩසටහන් සඳහා රු. 4,350,717 ක් වියදම් කර තිබුණි.

(ආ) බදුල්ල මහ නගර සභාවේ මහා පරිමාණ කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා 2008 – 2010 වර්ෂයන් තුළ රු. 60,867,560 ක් ලබා දී තිබු නමුත් අදාල ඉදිකිරීම් නවතා දමා තිබුණි. මේ නිසා රු. 39,000,000 ක මුදලක් කසල ඉවත් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ලබා දී තිබුණි. කසල ඉවත් කිරීම නගර සභාවේ කාර්යයක් බැවින් මෙම ගෙවීම ව්‍යාපෘති අරමුදල් අයථා පරිහරණය කිරීමක් බව නිරීක්ෂණය විය.

(ඇ) පිරිවැය රු. 183,000 බැගින් වු යතුරුපැදි 13 ක් ණය සහන පදනම මත රු.91,500 ක් බැගින් සේවකයන්ට ලබා දී තිබු අතර මෙම පදනම මත ලබා ගත් යතුරුපැදි 13 න් අධිකාරියට රු.1,189,500 ක අලාභයක් දැරීමට සිදුවී තිබුණි.

## 4.4 දෘශ්‍ය අක්‍රමිකතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය මගින් පොලිතීන් පටල සැකසීමේ යන්ත්‍රයක් සහ ප්ලාස්ටික් පොලිතීන් ඇට සැකසීමේ යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කිරීම සඳහා රු. 6,215,000 ක් වැය කර තිබු අතර සැලසුමකින් තොරව හදිසි අවශ්‍යතාවය සේ සලකා යන්ත්‍රය ගුවනින් ගෙන්වීම නිසා රු. 1,225,000 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) පිරිවැය රු. 176,696 ක් වු කැමරා 13 ක් පිලිසරු ව්‍යාපෘතියෙන් මිලදී ගෙන අධිකාරියේ පරිසර නිලධාරීන්ට බෙදා හැර ස්ථාවර වත්කම් වලින් කපා හැර තිබුණි.

(ඇ) අනතුරකට භාජනය වී තිබූ වාහනයකින් රු. 270,545 ක අලාභයක් සිදුවී තිබුණද, එකී අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර වියදම් ලෙස කපාහැර තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මයික්‍රෝන 20 ට අඩු පොලිතීන් නිෂ්පාදන පරීක්ෂාව සඳහා 2007 වර්ෂයේදී රු. 452,660 ක් වියදම් කර මිලදී ගෙන තිබු පරීක්ෂණ උපකරණ 10 ක්, 2015 අප්‍රේල් අවසානය දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) සංචිත වාහන සඳහා සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද යතුරු පැදි 40 ක් මාස 06 ක් නිෂ්කාර්යව තිබු අතර ඉන් 27 ක් 2015 මාර්තු 31 දින දක්වා නිෂ්කාර්යව පැවතුණි.

## 4.6 ආර්ථික නොවන ගණුදෙනු

දොම්පේ සනීපාරක්ෂක බිම් පිරවුම් ව්‍යාපෘතියේ කසල රඳවුම් ඉදිකිරීමට අදාලව ජල තත්ත්ව පරීක්ෂාව (Baseline data on water quality) මධ්‍යම පරිසර අධිකාරියේ විද්‍යාගාරයෙන් සිදු කරගත හැකි වුවද බාහිර ආයතනයකට රු.108,735 ක් ගෙවා පරීක්ෂණ කටයුතු සිදුකර ගෙන තිබුණි.

**4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිර්වායු ජීර්ණ තාක්ෂණය යොදාගනිමින් කසල කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා අධිකාරිය 2012 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම අනුව ව්‍යාපෘතිය 2015 ජනවාරි මාසයේදී නිම කිරීමට ගිවිසගෙන තිබුණු අතර එහි ඇස්තමේන්තුගත පිරිවැය රු. 121,782,000 ක් විය. මෙකී ඇස්තමේන්තුගත මුදලින් සියයට 53 ක් එනම් රු. 64,356,400 ක් ගෙවිය හැකි උපරිම අත්තිකාරම් සීමාව සියයට 20 ක ප්‍රමාණය ඉක්මවා ගෙවා තිබුණි. ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 121 ක් ආයෝජනය කිරීමට තීරණය කර තිබුණද ව්‍යාපෘතිය පිළිබඳ  ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. එසේම 2015 ජුලි 30 දක්වා ව්‍යාපෘතිය පිළිබඳ ප්‍රගති වාර්තාවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය සඳහා අවශ්‍යතාවය ඇගැයීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී කසල එකතු කිරීමේ බඳුන් 2,000 ක් පෞද්ගලික සමාගමකින් මිලදී ගැනීම සඳහා රු. 6,797,976 ක් වැය කර තිබු අතර ඒ සඳහා ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. මේ නිසා බඳුන් 1,400 ක්  ලැබීමට මාස දෙකක කාලයක් ප්‍රමාද වී තිබුණද ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකිරීමට නොහැකි වී තිබුණි. කසල බඳුන් ලැබීම් හා නිකුත් කිරීම සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛනයක් විධිමත් පරිදි සටහන් කර නොතිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 1,151ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 854 ක් විය. අනුමත කාර්ය මණ්ඩලයට අනුව කාර්ය මණ්ඩල පුරප්පාඩු 297 ක් විය. පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණු අතර අනුමැතිය නොලත් තනතුරු 08 ක් සඳහා බඳවා ගත් නිලධාරීන් වෙනුවෙන්  රු.3,366,535 ක වැටුප් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

(ආ) අධිකාරියේ තනතුරු සඳහා තිබිය යුතු නිශ්චිත සුදුසුකම් සහිතව බඳවාගැනීමේ පරිපාටියක් සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ අනුමත කාර්යමණ්ඩල විස්තරවලට අනුව  රහස්‍ය ලේකම් තනතුරු 02 ක් තිබුණද, අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව වැඩ පැවරුම් පදනම මත අතිරේක රහස්‍ය ලේකම්වරියක් පත්කර තිබුණි.

(ඈ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අංක 33 හි නියමයන්ට පටහැනිව ආර්ථික සහයෝගිතා අරමුදල් ණය පහසුකම් මත ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කළමනාකරු (සැපයුම් හා සේවා) තනතුර සඳහා නියමිත සුදුසුකම් නොමැති නිලධාරියෙකු බඳවාගෙන මාසිකව රු.95,000 බැගින් හා දීමනා වල එකතුව ලෙස රු.2,203,379 ක දළ වැටුපක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. එසේම ව්‍යාපෘතියේ කටයුතු කාර්යක්ෂමව ඉටුකළ හැකි වන පරිදි සේවක පුරප්පාඩු 11 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.

(ඉ) අමාත්‍ය කාර්යාලයේ මාධ්‍ය සම්බන්ධීකාරක ලෙස අනුයුක්ත කර තිබුණු නිලධාරියාට 2013 මැයි සිට 2014 දෙසැම්බර් දක්වා වැටුප් හා අතිකාල වශයෙන් රු. 435,146 ක් පසුභාවිත ප්ලාස්ටික් ව්‍යාපෘතියෙන් ගෙවා තිබුණි.

(ඊ) නියමිත සුදුසුකම් නොමැති නිලධාරීන් තිදෙනෙකු පිළිසරු ව්‍යාපෘතියේ ඉහළ කාර්ය මණ්ඩලයට බඳවාගෙන තිබුණු අතර 2015 ජූනි 30 දක්වා ව්‍යාපෘතියෙහි පුරවා නොතිබුණු පුරප්පාඩු සංඛ්‍යාව 14 ක් විය.

**4.9 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් අධිකාරියේ සම්පත්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට අධිකාරියෙන් වැටුප් ලබන නමුත් අධිකාරියෙන් බාහිර වෙනත් ආයතනවල සේවය සඳහා නිලධාරීන් තිදෙනෙකු මුදාහැර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකර තිබුණු නමුත් මෙම වාර්තාවේ දිනය දක්වා නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දොම්පේ සනීපාරක්ෂක කසල බිම් පිරවුම ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු වලට අදාළව සිදුවී තිබුණු රු.49,623,542 ක අලාභය අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම.

(ආ) දොම්පේ සනීපාරක්ෂක කසල රඳවන බිම් පිරවුම් ව්‍යාපෘති පරිශ්‍රයේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා රු. මිලියන 22.26 ක අධි ඇස්තමේන්තුවක් කර තිබූ අතර, කොන්ත්‍රාත්කරුට රු. මිලියන 8.15 ක් වැඩිපුර ගෙවා තිබීම හා ඉදිකළ මාර්ගය ප්‍රමිතියෙන් තොරවීම.

(ඇ) ජාතික රසායනික ද්‍රව්‍ය පැතිකඩ යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේදී නිමකිරීමට නියමිතව තිබූ නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලසුම පිළියෙල කිරීම 2015 අප්‍රේල් වන විටත් නිමකර කර නොතිබීම.

(ඈ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය කර වැඩිදියුණු කිරීමට අවශ්‍ය හඳුනාගත් අංශයන් 18 ක් වෙනුවෙන් පනතේ සංශෝධනයන් සිදුකර නොතිබීම.

**5.3 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා**

නාය ගඟ කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය මඟින් සමනළ අඩවිය රක්ෂිතය තුළ ඇලි 07 නමින් හැඳින්වෙන දිය ඇලි 07 න් 06 වන ඇල්ලට ඉහළින් අමුණක් ඉදිකර ජලය හරවා විදුලි බලාගාරය තැනීම මඟින් සිදුවී තිබූ පරිසර හානිය සම්බන්ධව ලැබී තිබූ පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.මේ අනුව මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා සඳහා අනුමැතිය ලබා දීමේදී පාරිසරික අවදානම් තත්ත්වයන් නොසලකා

හැරීම නිසා මෙවැනි පාරිසරික හානි සිදුවී තිබුණි. මේ අනුව අධිකාරිය මූලික සමාජ වගකීමෙන් බැහැර වී ඇති බව නිරීක්ෂණය විය.

**(ආ) පරිසර බලපෑම් ඇගයීම් වාර්තා :**

**------------------------------------------**

උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පරිසර අනුමැතිය ලබා දීමට අදාල කොන්දේසි සපුරාලීමට ව්‍යාපෘති යෝජක වන ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය අපොහොසත් වී ඇති බව ක්ෂේත්‍ර පරීක්ෂණවලදී හා පසු විපරම් පරීක්ෂණවලදී තහවුරු කරගෙන තිබුණද එම නිරීක්ෂණයන් නොසලකා 2011 අප්‍රේල් 12 සිට 2017 අප්‍රේල් 12 දක්වා පරිසර බලපෑම් ඇගයීමේ අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් මහජන නියෝජන පැමිණිලි 113 ක් ලැබී තිබුණද ඒ පිළිබඳව කළමනාකරණය අවධානය යොමුකර නොතිබුණි.

**(ඇ) පරිසර පැමිණිලි :**

**-------------------**

සමාලෝචිත වර්ෂය තුළ පරිසර පැමිණිලි 2,053 ක් ලැබී තිබූ අතර ඉන් 1,614 ක් හෙවත් සියයට 79 ක් විසඳී නොතිබුණි. මේ අනුව පැමිණිලි විසඳීමේ ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

**-------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයා වෙත දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) පාරිසරික වගකීම් ඉටුකිරීමේ ප්‍රගතිය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) අභ්‍යන්තර විගණනය